**ශීර්ෂය 115 ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය**

**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

**විගණන විෂය පථය**

ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 28 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.12 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) විගණන සාක්ෂි නොවීම**

(i) නිලධාරීන්ගේ පැමිණීම් හා පිටවීම් තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි අමාත්‍යාංශයේ නොතිබීම නිසා 2013 වර්ෂය තුළ අමාත්‍ය කාර්යාලයෙහි හා නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලයෙහි සේවයේ නියුතුව සිටි නිලධාරීන් හතලිස් තුන් දෙනෙක් (43) වෙනුවෙන් දරන ලද එකතුව රු.3,583,533ක් වූ අතිකාල හා ගමන් වියදම් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කළ නොහැකි විය.

(ii) අමාත්‍යාංශය සතු වාහන අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර ඇති බව තහවුරුකර ගැනීම සඳහා අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iii) බිල්පත්, ලේඛන ආදී වූ අවශ්‍ය සාක්ෂි නොතිබීම නිසා එකතුව රු.797,335ක මුදලකට අදාල අමාත්‍යාංශයෙහි ගනුදෙනු 05ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කළ නොහැකි විය.

**(ආ) විසර්ජන ගිණුම්**

(i) **මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.132,000,000ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.123,650,580ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.8,349,420ක් හෙවත් සියයට 6.3 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 115,000,000 | 110,705,988 | 4,294,012 | 3.7 |
| මූලධන | 17,000,000 | 12,944,592 | 4,055,408 | 23.8 |
| එකතුව | 132,000,000 | 123,650,580 | 8,349,420 | 6.3 |

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 11501 | 4,000,000 | 3,187,424 | 1,200,000 | 3,274,317 | 13,000,000 | 9,765,590 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 11501 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.104,336ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

(ii) අමාත්‍යාංශය විසින් ණය ගෙවීමේදී පිළිපැදිය යුතු විධිවිධාන අනුගමනය නොකර රු.91,217ක ණය ගෙවා තිබුණි.

**(ඈ) අග්‍රිම ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 371 හි සඳහන් විධිවිධානයන්ට පටහැනි ලෙස මාණ්ඩලික නොවන නිලධාරීන් 03කට අවස්ථා 05කදී එකතුව රු.100,000ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව එක් මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් වරකදී නිකුත් කළ හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු.20,000ක් වී තිබුණත්, එම

රෙගුලාසිවලට පටහැනිව අවස්ථා 02කදී එක් නිලධාරිනියක් වෙත රු.20,000ක් ඉක්මවූ එකතුව රු.56,840ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

## 1.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

අමාත්‍යාංශය විසින් නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලය වෙනුවෙන් බදු කුලී පදනම යටතේ ලබා ගෙන තිබූ පර්චස් 33ක භූමිය හා එහි පිහිටි වර්ග මීටර් 462ක දෙමහල් ගොඩනැගිල්ල සඳහා 2013 ජූනි සිට 2014 ජූනි දක්වා රු.5,483,520ක් බදු කුලී වශයෙන් ගෙවා තිබූ නමුදු එම ගොඩනැගිල්ලේ එකී කාර්යාලය ස්ථාපිත කර නොතිබුණි.

### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2012 සහ 2013 වර්ෂවලට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලට අනුව ප්‍රයෝජනයට ගත නොහැකි බැවින් විකිණිය යුතු බව දක්වා තිබූ පිළිවෙලින් රු.1,380,633ක් සහ රු.1,589,850ක් වූ වත්කම් සම්බන්ධයෙන් අමාත්‍යාංශය කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### (ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතුව තිබුණු වාහන 5ක් විධිමත් අනුමැතියකින් තොරව හා ජනාධිපති ලේකම්ගේ අංක සීඒ/1/17/1 හා 2010 මැයි 14 දිනැති චක්‍රලේඛයේ 3:3 ඡේදයේ උපදෙස්වලට පටහැනිව වාහන 4ක් භාවිතයට ගෙන තිබූ අතර, මෙම වාහන ලබාගත් දිනය, පරිහරණය කළ පුද්ගලයින් ආදිය පිළිබඳ විස්තර කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### (ඈ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම

කුලී ගිවිසුමක් යටතේ ලබාගත් ගොඩනැගිල්ලක අමාත්‍යාංශ කාර්යාලය පවත්වාගෙන යනු ලබන අතර කුලී ගිවිසුමෙහි 19 වැනි වගන්තියට පටහැනිව වැඩිදියුණු කිරීම් සඳහා අවස්ථා 03කදී භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝගී කර ගෙන ප්‍රාග්ධන වියදම් වශයෙන් රු.234,962ක් වැය කර තිබුණි.

**1.5 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | |
| (i) මුදල් රෙගුලාසි 454 | 464,391 | අමාත්‍යාංශය විසින් මිලදී ගෙන තිබූ ගෘහ භාණ්ඩ හා උපකරණ ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුලත් කිරීමකින් තොරව නිල නිවාස 02ක් වෙත නිකුත් කර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1645 හා 1646 | - | සංචිතයට අයත් වාහන 07ක ධාවන සටහන් හා 268(අ) ආකෘති පත්‍රයේ ලියා ඉදිරිපත් කළයුතු ගමන් පිළිබඳ මාසික සාරාංශ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) **ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ** | | |
| 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන චක්‍රලේඛයේ 5.1 සහ 5.2 ඡේද | - | නිළධාරින් හයදෙනෙකු වෙනුවෙන් අනුමත සීමාව ඉක්මවා දුරකථන සම්බන්ධතා 11 ක් ලබාදී තිබුණි. |
| (ඇ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| (i) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයේ 2.11 ඡේදය | - | අමාත්‍යාංශයට අයත් වාහනවල සෑම මාස 6කට වරක් ඉන්ධන දැවීම පරීක්ෂාකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) 2006 ජුලි 14 දිනැති අංක 11/2006 දරන චක්‍රලේඛයේ IV ඡේදය | - | නිලධාරීන්ට අනුයුක්ත කර තිබූ වාහනවලට අදාලව දෛනික ධාවන සටහන් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii)2008 ජුනි 26 දිනැති අංක 14/2008 චක්‍රලේඛයේ 1(11) ඡේදය | - | වාහන දිමනාව හා ඉන්ධන දීමනාව ලබාගන්නා අමාත්‍ය හා නියෝජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලයේ නිලධාරීන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් නිදහස් කර තිබූ වාහන භාවිතා කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය. |
| (iv) 2009 ජුනි 17 දිනැති අංක 09/2009(1) දරන චක්‍රලේඛය | - | අමාත්‍ය කාර්ය මණ්ඩලයේ සේවකයින් පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍ර මගින් සනාථ කර නොතිබුණි. |
| (ඇ) **රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | |
| 2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන චක්‍රලේඛයේ 02 ඡේදය | 59,641 | අමාත්‍යාංශ නිළධාරින් දෙදෙනෙකු වෙනුවෙන් අනුමත සීමාව ඉක්මවා දූරකථන බිල්පත් ගෙවා තිබුණි. |
| (ඉ) **ජාතික අයවැය චක්‍රලේඛ** | | |
| (i) 2010 අප්‍රේල් 29 දිනැති අංක 146 දරන චක්‍රලේඛයේ 01 ඡේදය | 7,787,617 | අමාත්‍යාංශ පරිශ්‍රයෙන් පිටත පවත්වාගෙන යනු ලබන නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලය වෙනුවෙන් 2013 වර්ෂය තුල බදුකුලී හා වෙනත් වියදම් වශයෙන් රු.7,787,617ක් ගෙවා තිබුණි. |
| (ii) 2013 අප්‍රේල් 16 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අංක HRD/CHI/S/194 දරන චක්‍රලේඛ ලිපිය | - | චීනයේ පවත්වන ලද වැඩමුළුව සඳහා අමාත්‍යාංශයෙන් සහභාගීවී තිබූ නිළධාරිනිය විසින් ලබාගත් පුහුණුව පිළිබඳ වාර්තාවක් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට හෝ මෙම අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 1.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වසර 43ක් පැරණි සපුගස්කන්ද තෙල් පිරිපහදුව ඉතා අඩු ධාරිතාවයක් මත ක්‍රියාත්මක වූ බැවින්, එය වර්තමානයේ පවත්නා ඕනෑම බොරතෙල් වර්ගයක් පිරිසිදු කිරිමට හැකි ඉහල තාක්ෂණික මෙවලම් සහිතව උසස් තත්වයට නවීකරණය කිරිමේ අවශ්‍යතාවය පැවතියද මේ සඳහා නියමිත නවීකරණය හා පුළුල් කිරීමේ ව්‍යාපෘතිය 2013 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. මේ නිසා බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කිරීම, විදේශ විනිමය රටට ඉතිරිකර දීම, ආනයනික පිරිපහදු තෙල්වල ගුණාත්මකභාවය පිළිබඳ පවත්නා ගැටළු අවම කර ගැනීම, නිමි තෙල් (Finished Products) ආනයනය කිරීමට වැයවන අධික පිරිවැය අවම කිරීම, ආනයනික බොර තෙල් දේශීයව පිරිපහදු කිරීම තුලින් ලැබෙන තෙල් නිෂ්පාදනයේ ආර්ථික වාසිය ලබා ගැනීම, මිල අඩු මට්ටමක පවතින බොර තෙල් (Heavy Crude Oil) භාවිතා කිරීමට ලැබෙන හැකියාව හා මෙහෙයුම් ලාභදායිත්වය වර්ධනය කර ගැනීමට හැකිවීම යන වාසිදායක තත්ත්වයන් ලඟා කර ගැනීමට ඇති හැකියාව මඟහැරී තිබුණි.

(ආ) ඛනිජ තෙල් ප්‍රවාහන නළ මාර්ගවල අපේක්ෂිත ජීවිත කාලය අවුරුදු 25ක් පමණ වුවද, දැනට පවතින වසර 43ක් සහ වසර 70ක් පැරණි ඛනිජ තෙල් ප්‍රවාහන නළ මාර්ග පද්ධතිය මගින් එහි සඵල ආයුකාලය වූ වසර 25 ඉක්මවා දීර්ඝ කාලයක් තිස්සේ මෙරට නිමි ඛනිජ තෙල් අවශ්‍යතාවයෙන් 2/3 ක් පමණ සපුරා ගනු ලබයි. එසේ පරිහානියට පත් නළ මාර්ගය හරහා ප්‍රවාහනය කිරීම අනතුරුදායක බැවින් රට හරහා දිවෙන නළ මාර්ග ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාවට නැංවිමට අපේක්ෂාකර තිබුණද, 2013 දෙසැම්බර් 31 දින වන විටත් මෙම ව්‍යාපෘතිය ආරම්භකර නොතිබුණි. මේ නිසා, ඛනිජ තෙල් ප්‍රවාහනය කාර්යක්ෂමව සිදුකිරීම, පාරිභොගිකයාට ලැබෙන ඛනිජ තෙල්වල ඉහල ගුණාත්මකභාවය, අනාගතයේ වැඩිවන ඉල්ලුම සපුරාලීම, ඛනිජ තෙල් තොග හීනවීමේ පාඩු හා මූල්‍ය පාඩු අවමවීම, අබලන් නල මාර්ග නඩත්තු කිරීමේ පිරිවැය අවම වීම යන වාසිදායක ප්‍රතිලාභ ලබා ගැනීමට තිබූ අවස්ථා අහිමි වී තිබුණි.

(ඇ) බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ භූගත තෙල් නල පද්ධතිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 1,000 ක වියදමින් තාක්ෂණික අධ්‍යයන අවසන් කර එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණද, එකී ඉදිකිරීම් කටයුතුවල තත්ත්වය පිලිබඳව ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**1.7 අවිධිමත් ගනුදෙනු**

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

(i) 2013 ජනවාරි 14 සිට 17 දින දක්වා ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යවරයා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සිදුකර තිබූ සංචාරය වෙනුවෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.1 ඡේදයට පටහැනිව, මිල කැඳවීමකින් තොරව අමාත්‍යාංශය විසින් රු.277,181ක් වටිනාකමැති ගුවන් ටිකට් පත් මිලදී ගෙන තිබුණි.

(ii) අමාත්‍යාංශය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 ඡේදයට පටහැනිව, මිල ගණන් කැඳවීමකින් තොරව වාහන අලුත්වැඩියා කර තිබූ බොහෝ අවස්ථා නිරීක්ෂණය වූ අතර එසේ අධික මිල ගණන් යටතේ ටොයෝටා ලංකා සමාගම වෙතින් සිදුකර තිබූ වාහන අලුත්වැඩියා වෙනුවෙන් වර්ෂය තුළ රු.1,270,565ක් වැය කර තිබුණි.

**(ආ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

ජංගම දුරකථනයක් රු.135,000කට මිලදීගෙන මාස 07කට පසු එය අස්ථානගත වී තිබුණි. ඒ වෙනුවට රු.109,500ක් වැය කර නැවත තවත් ජංගම දුරකථනයක් ලබා දී තිබූ නමුත් දුරකථනය අස්ථානගතවීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ බවට කිසිඳු සාක්ෂියක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**1.8 වංචනික ස්වරූපයේ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

චීනයේ පවත්වන ලද වැඩමුළුවක් සඳහා සහභාගී වී තිබූ අමාත්‍යාංශයේ නිලධාරිනියක් වෙත විදේශ සංචාරයට අදාල සියළුම වියදම් අදාල විදේශ ආයතනය විසින් ලබා දි තිබියදී, ඒ බව දැනුම් දීමකින් තොරව අමාත්‍යාංශයෙන් රු.1,289,541ක මුදලක් ලබා ගෙන දින 25 ක කාලයක් අයථා ලෙස පරිහරනය කර තිබුණි.

## 1.9 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2013 වර්ෂය තුළදී හදිසි අනතුරු හේතුවෙන් අමාත්‍යාංශ වාහන 10කට හානි සිදුවී තිබූ අතර අළුත්වැඩියා කිරීම සඳහා රු.4,860,508ක් වැයකර තිබුණි. එහෙත් ඒ සඳහා රක්ෂණ වන්දි වශයෙන් ලැබී තිබුණේ රු.4,696,214ක් පමණක් වූ බැවින් අමාත්‍යාංශයට සිදුවී තිබූ පාඩුව රු.164,294ක් විය.

(ආ) එසේම, ඉකුත් වර්ෂයේ එසේ සිදුවී තිබූ රු.159,098ක පාඩුව ද ඇතුළත්ව, 2009-2012 කාල පරිච්ඡේදය තුළ අනතුරුවලට ලක්වී තිබූ අමාත්‍යාංශය සතු වාහන අළුත්වැඩියා කිරීම සඳහා ලැබී තිබූ රක්ෂණ වන්දි ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අමාත්‍යාංශයට සිදුවී තිබූ පාඩුව රු.203,268ක් විය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී ද අමාත්‍යාංශය මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශය විසින් මිලදී ගෙන අමාත්‍ය කාර්යාලයේ මාධ්‍ය අංශය වෙත ලබා දී තිබූ කැමරාවකට හානි වී තිබූ අතර වගකීම් කාලසීමාව ඇතුළත සිදුකර තිබූ අලුත්වැඩියාවක් වෙනුවෙන් අමාතෝ‍යාංශය රු.48,500ක් වැය කර තිබුණි. එහෙත් මෙම පාඩුව අදාල නිලධාරියාගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 1.10 අනාර්ථික ගනුදෙනු

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශය විසින් වාහන අළුත්වැඩියාව සඳහා යොමු කිරීමේදී, 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව ඒ පිළිබඳ විශේෂ දැනුමක් ඇති ස්වාධීන පුද්ගලයෙකුගෙන් හෝ ආයතනයකින් වාහනය පරීක්‍ෂා කරවාගෙන ඇස්තමේන්තුවක් ලබාගැනීම හෝ අළුත්වැඩියාවෙන් පසු එය නිසි පරිදි ඉටුකර තිබෙන බවට ඒ පිලිබඳ විශේෂ දැනුමක් ඇති ස්වාධීන පුද්ගලයෙක් හෝ ආයතනයක් මගින් සහතික කරවා ගැනීමකින් තොරව, 2013 වර්ෂය තුළ වාහන 17ක් අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.3,873,572ක් වැය කර තිබුණි.

(ආ) 2013 වර්ෂය තුළ අමාත්‍යාංශයට අයත් නොවන වාහන 02ක නඩත්තු කටයුතු වෙනුවෙන් අමාත්‍යාංශය රු.409,854ක් වැය කර තිබුණි.

(ඇ) 2013 වර්ෂය තුල නියෝජ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් වාහන 03ක් සඳහා ඉන්ධන දීමනා වශයෙන් රු.2,537,500ක් අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ වැයකර තිබූ නමුදු ඉන් වාහන 2ක් පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණු බැවින් එම වාහන දෙක වෙනුවෙන් දරන ලද රු.1,670,500ක් වූ ඉන්ධන වියදමේ නිවැරදිතාවය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඈ) 2013 වර්ෂය තුල නියෝජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලයෙහි නිලධාරීන් පස්දෙනෙකු ඉන්ධන දීමනා වශයෙන් රු.2,155,056ක් හා නිලධාරීන් තිදෙනෙකු ප්‍රවාහන දීමනා වශයෙන් රු.1,080,000ක් ලබාගෙන තිබූ නමුදු මෙම නිලධාරීන් භාවිතා කළ වාහන පිළිබඳ විස්තර කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එසේ වුවද, 2013 වර්ෂය තුළ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් වාහන 4ක් ඉන්ධන සහිතව නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලය වෙත නිදහස් කර තිබූ අතර සංස්ථාව විසින් ඒ සඳහා රු.1,113,948ක වියදමක් දරා තිබුණි.

(ඉ) අමාත්‍ය කාර්ය මණ්ඩලයට අයත් සම්බන්ධීකරණ ලේකම්වරයෙකු වෙත 2013 මැයි සිට දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදය සඳහා ප්‍රවාහන දීමනාව හා ඉන්ධන දීමනාව ලෙස රු.522,528ක් ගෙවා තිබුණි. එහෙත් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව රියදුරෙකු සහ ඉන්ධන සහිතව අමාත්‍ය කාර්යාලය වෙත නිදහස් කරන ලද වාහනයක් මෙම නිලධාරියා විසින් අදාල කාල පරිච්ඡේදය තුළ භාවිතා කර තිබූ බව අනාවරණය විය. මෙම වාහනය සඳහා සංස්ථාව විසින් අදාල කාල පරිච්ඡේදය තුළ ඩීසල් ලීටර් 1,421ක් නිකුත් කර තිබූ අතර අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.882,869ක් වැය කර තිබුණි.

## 1.11 කළමනාකරණ දුර්වලතා

---------------------------

වාහන භාවිතය පිළිබඳ විගණන පරීක්ෂණවලදී පහත සඳහන් කළමනාකරණ දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) අමාත්‍ය කාර්යාලයේ හා නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලයේ සේවයේ නියුතුව සිටි නිලධාරීන් වෙත 2013 වර්ෂය තුළ අතිකාල හා ගමන් වියදම් වශයෙන් ගෙවා තිබූ රු.3,583,533ක වියදමට අදාල ගෙවීම් වවුචර් පරීක්ෂාවේදී, අදාල නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම පිළිබඳ තහවුරු කර ගැනීමකින් තොරව නිර්දේශ කිරීම, ගෙවීම් අනුමත කිරීම හා වියදම් සහතික කිරීම සිදුකර තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) අමාත්‍යාංශය විසින් වාහන ලේඛනයක් නඩත්තු කර නොතිබූ අතර සංචිත වාහන හා නිළ වාහන වෙන්ව හඳුනා ගැනීම සඳහා ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. එසේම, වාහන අළුත්වැඩියා සම්බන්ධව ලේඛනයක්ද නඩත්තු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) 2013 වර්ෂය තුළ සිදුකළ වාහන අළුත්වැඩියාවන් සහ අළුත්වැඩියාවෙන් පසු ඉවත් කරන ලද කොටස් නැවත ගබඩාව වෙත භාර දීම ආදී විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි. එසේම, වාහන අළුත්වැඩියාවන් පිළිබඳ විස්තර ලොග් පොත්වල ඇතුළත් කර නොතිබුණි.

(ඇ) සංචිතයට අයත් වාහන 07ක් සඳහා 2013 වර්ෂය තුළ ඉන්ධන වියදම් වශයෙන් රු.1,540,938ක් අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ වැයකර තිබූ නමුත්, ධාවන සටහන් ඉදිරිපත් නොකිරීම, ලොග් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබීම, මාස හයකට වරක් ඉන්ධන දහනය පරීක්ෂාකර නොතිබීම ආදිය හේතුවෙන් එම වියදම්වල ආර්ථිකභාවය පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

**1.12 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 11 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 52 | 40 | 12 |
| (iii) | ද්විතියික මට්ටම | 02 | 01 | 01 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 27 | 20 | 07 |
| | එකතුව | 96 | 72 | 24 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 24 ක් පිරවීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

---------------------------------------------------------------------

අමාත්‍යාංශයේ ව්‍යාපෘති අංක 02 - අමාත්‍යාංශ පරිපාලනය සහ ආයතන සේවා යටතේ බඳවාගෙන තිබූ මෙහෙයුම් කාර්ය මණ්ඩලයෙහි නිලධාරියෙකු, ව්‍යාපෘති අංක 01 යටතේ වූ අමාත්‍ය කාර්යාලයේ මාධ්‍ය අංශයේ සේවයේ යොදවා තිබූ අතර, ඔහු වෙත අමාත්‍යාංශ පරිපාලනය සහ ආයතන සේවා යටතේ කිසිඳු රාජකාරියක් පවරා නොතිබුණි. එසේ වුවද, අමාත්‍යාංශයේ ව්‍යාපෘති අංක 02 යටතේ වූ ප්‍රතිපාදනවලින් 2013 වර්ෂය තුළ මෙම නිලධාරියා වෙනුවෙන් රු.242,607ක වියදමක් දරා තිබුණි.